# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 අගෝස්තු/ සැප්තැම්බර්

සමාජීය විද්‍යා පීඨය

## පුරාවිද්‍යාව (පැරණි නිර්දේශය)

## අභිලේඛන සහ නාණක විද්‍යාව ARCH – E 2025

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. අනිවාර්ය ප්‍රශ්නය ඇතුළත්ව සෑම කොටසක්ම ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න. (පිළිතුරු පහක් තිබිය යුතුය.)

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

### පළමු කොටස

පළමු කොටස අනු කොටස් පහකින් සමන්විත වේ.

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. එක් නිවැරදි පිළිතුරකට ලකුණු දහයක් (10) හිමි වේ. නිවැරදිව අදහස තේරුම් ගතහැකි පරිදි රචනයට ලකුණු 06 ක් ද නිවැරදි අක්ෂර රචනයට ලකුණු 04 ද බැගිනි. (ලකුණු 50)

01. i. පහත දක්වා ඇති අභිලේඛන නූතන අක්ෂරයෙන් ලියා එහි අර්ථය ද ලියා දක්වන්න.

ගිරිනාර් ලිපිය



ii. පහත දක්වා ඇති ලේඛනය තත්කාලීන අක්ෂරයෙන් ලියා දක්වමින් වර්තමාන බසට පරිවර්තනය කරන්න.

එරුපොතාන ලිපිය (ක්‍රි.පූ. 1-3 සියවස්)

පරුමක නදි පුතශ පරුමක මිතශ ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ දිනෙ

iii. පහත වර්තමාන සරළ බසින් දක්වා ඇති ලේඛන තත්කාලීන අක්ෂර භාවිතයෙන් පෙළ ලියා දක්වමින් එහි සිංහල අර්ථය ද ලියන්න.

වල්ලිපුරම් රන් සන්නස (ක්‍රි.ව. 1-2 සියවස්)

යහපතක් වේවා. වසභ මහරජුගේ රාජ්‍යයෙහි අමාත්‍ය ඉසිගිරිය නාගදීපය පාලනය කරන සමයෙහි භද්‍රකාර නම් ආස්ථානයෙහි පියංගුක තිස්ස නම් ආරාමය කරවන ලදී.

iv. තමන් කැමති ඕනෑම බ්‍රාහ්මී අක්ෂර පහක පරිණාමය උදාහරණ සහිතව පෙන්වා දෙන්න.

v. අතීතය ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා අභිලේඛනයන් හි වැදගත්කම මැයෙන් කෙටි රචනයක් ලියන්න. (වචන උපරිමය 250කි.)

## දෙවන කොටස

02. අභිලේඛන පර්යේෂණ විෂයෙහි සිරිමල් රණවැල්ලගේ දායකත්වය පෙන්වා දෙන්න.

03. සීගිරි කැටපිතෙහි පුරාවිද්‍යාත්මක වැදගත්කම අගයන්න.

04. අත්තාණි ලේඛනවල විශේෂ ලක්ෂණ උදාහරණ සහිතව පෙන්වා දෙන්න.

## තෙවන කොටස

05. භාණ්ඩ හුවමාරු ඉතිහාසය පැහැදිලි කරන්න.

06. පොළොන්නරු කාසි පිළිබඳව පූර්ණ විස්තරයක් කරන්න.

07. අනුරාධපුර සමයට අයත් කාසිවල දැක්වෙන මංගල සම්මත සංකේත රූප සටහන් ඇඳ දක්වමින් විස්තර කරන්න.

08. පහත දක්වා ඇති මාතෘකා අතුරින් <u>දෙකකට</u> පිළිතුරු සපයන්න.

i. ශ්‍රී ලක්ෂ්මී කාසිය
ii. රුවන්වැලි සෑ පුවරු ලිපිය (ගජබාහු)
iii. ශ්‍රී ලංකාවේ රන් කහවණුව
iv. රුහුණෙන් හමුවන අක්ෂර සහිත කාසි
v. එල්ලාවල මේධානන්ද හිමියන්ගේ අභිලේඛන පර්යේෂණ

************************************